# ඩී. බී. කුරුප්පු
## 'විගාමික සාහිත්‍ය අඹරේ ගුරු තරුව'



**ආචාර්ය පාලිත ගණේවත්ත**

ඩී. බී. කුරුප්පු මහතාගේ අභාවය පිරිමැසිය නොහැකි පාඩුවක් බව කිවමනා නොවේ. ඩී. බී. කුරුප්පු මහතා මිය යන තෙක්ම තම දිවි දෙවෙනි කොට ආදරය කළ ලිවීමේ කාර්යය අතහැරියේ නැත. වියපත් මහල්ලකු ලෙස නොව නව යොවුන් තරුණයකු ලෙස අනාගතය දෙස සර්ව සුභවාදී දැකීමකින් හා අප්‍රතිහත ධෛර්යයෙන් යුතුව ලෝකයේ සිදුවීම් දෙස විමසුම් ඇස හෙළමින් සක්‍රිය මනසකින් යුතුව දිවි ගෙවීමට පසුබට වූයේ නැත; මතයට හා අදහසට පමණක් මතයක් හෝ අදහසකට එරෙහිව පෑන මෙහෙයවීමට බිය වූයේ නැත; ඔහුගේම වදනින් කිවහොත් 'කැත්තට පොල්ල' මෙන් අදහස් පළ කිරීමටත් ලිවීමටත් නිරභය වූයේය.

මෙල්බර්න් නුවරට ආ හැම විටකම වාගේ මම කුරුප්පු මහතා හමුවන්නට ගියෙමි. ඒ හැම වාරයකට වාගේ ඔහු තමන්ගේ පොත් එකක් හෝ කිහිපයක් මට තෑගි කලේය. ඔහු 'මහළු මඩමේ' සිටි කළ ........ බෙහෙවින් දුකට පත්ව කුරුප්පු මහතාගේ අගය පහ-දමින් මෙල්බර්න් නුවර පළවන 'පහන' සඟරාවට ලිපියක් ලිව්වෙමි. සසල වූ හදින් කුරුප්පු මහතා කෙරෙහි උපන් දයාවෙන් ලියූ ඒ ලිපිය පළ කරන්නට කුරුප්පු මහතා අවසර නොදුන්නේය. එය පළ කිරීම තම ආත්මාභිමානයට කැලලක්යයි ඔහු සිතුවා සේය. මෙවැනි සිදුවීම් පිළිබඳව ඔහු තම පොත්පත් වල සඳහන් කළේය. මෙල්බර්න් නුවර හෝ සිඩ්නි නුවර හෝ තම සාහිත්‍යකාමී හිතවතුන් සමඟ විටින් විට නොහොඳ නෙ-ාක්කඩුකම් අති කර ගත්තේය. ඔවුන්ට නිර්දය ලෙස පහර දෙමින් පුවත්පත් වල ලිපි නළ කළේය; තම පොත් පොත්පත්වල ලිව්වේය. ඒ ඩී.බී. ගේ හැටිය. ඔහුගේ නිර්භය ස්-වභාවය අවංක කමින්, එඩිතර බවත් හෙළි කරන ගති පැවතුම්ය. කුරුප්පු මහතාගේ විවිධ ලිපි ලේඛන සම්බන්ධයෙන් අදාල පුද්ගලයන් කිසිවකුවත් කුරුප්පු මහතා සමග අමනාප වූයේ යයි මම නොසිතමි.

ඩී. බී. කුරුප්පු මහතා ඕස්ට්‍රේලියාවේ විශ්‍රාමික සිංහල සාහිත්‍ය අඹරේ පෑයූ ගුරු තරුව විය. සිංහල ඩයස්පෝරික හෙවත් විශ්‍රාමික සාහිත්‍යය වර්ධවය කිරීමේ පුරෝගාමී වූ කුරුප්පු මහතා මෙරට සිංහල ලේඛක ලේඛිකාවන් දිරිමත් කිරීමට විශිෂ්ඨ කාර්යභාරයක් ඉටු කළේය. මෙල්බර්න් නුවර පලවන සිංහල පුවත් පත් වලට ලියූ .......... ලිපි මගින් මෙරට පළවන සිංහල ලේඛකයන්ගේ නිර්මාණ පාඨක ලෝකයට හඳුන්වා දුන්නේය.

හත් වසරක පමණ පෙර කුරුප්පු මහතාගේ සාහිත්‍ය සේවය අගයමින් මම ලිපි පෙළක් ලිව්වෙමි. 'ඩී. බී. ගේ සාහිත්‍ය සේවය' නමින් 'සන්නස' පුවත් පතේ පළ වූ එම ලිපි පෙළ කුරුප්පු මහතාගේ නිර්මාණ පිළිබඳව මෙතෙක් පළ වූ එකම ලිපි සංග්‍රහය යයි මම විශ්වාස කරමි. ඒ ලිපි පිළිබඳව වැඩි ප්‍රතිච-ාරයක් නොදැක්වුවද තමා ඒ ලිපි පෙළ අගය කරන බව ඩී. බී. මා සමඟ කීවේය.




**සන්නස 2011 නොවැ කළාපය ඩීබී සහ පාලිත**

ඩී. බී. කුරුප්පු මහතා සිංහලෙන් හා ඉංග්‍රීසියෙන් ලියූ පොත් සංඛ්‍යාව හැටකට ආසන්න බව මම දනිමි. ඇතැම් විට ඊටත් වඩා වැඩි වන්නට පුළුවන. පොත් හත අටක්ට වැඩි ප්‍රමාණයක් තවමත් මුද්‍රනයේය. ලියූ පොත් සංඛ්‍යාව විශාල වූ පමණින් ලේඛකයාගේ විශිෂ්ඨත්වය වැඩි වන්නේ නැත. එහෙත් කුරුප්පු මහතා සම්බන්ධයෙන් මේ කියමන සාධාරණ නොවේ. ඩී. බී. ලීයූ හැම පොතක්ම විශිෂ්ඨ නිර්මාණයක් ලෙස හැඳින්වීමට මම පසුබට නොවෙමි. විවිධ විෂය කෙෂ්ත්‍රයන් හරහා ඩී.බී. ගේ බැල්ම යොමු විය. ඕස්ට්‍රේලියානු කෙටිකතා සිංහල පාඨකයනට පළමුවෙන් .......... ගෞරවය කුරුප්පු මහතාට හිමිවෙයි. ඕස්ට්‍රේලියාවේ ආදිවාසී ජනකතා පළමුවෙන්ම සිංහල පාඨකයන්ට තිළිණ කලෙත් කුරුප්පු මහතාය. මෙරට උපන් අපේ දරුවන්ට සිංහල ජනකතා ඉංග්‍රීසි බසින් ලිවීමට උත්සුක වූ කුරුප්පු මහතා කැකිල්ලේ, මහදැනමුත්තා, හා අන්දරේ ගැන සිඟිති පොත් පෙලක් ඉංග්‍රීසියෙන් පළ කළේය. කුරුප්පු මහතා ලියූ 'හොචිමිංගේ සිරගෙය දිනපොත' , අන්තර්භවය, 'අර්ධනාරි' යන පොත් මෙන්ම 'කාණ්ඩ හතකින් සමන්විත අර්ථවත් දරුවෝ' පොත් පෙළ එතුමා විශිෂ්ඨ පරිවර්තකයෙකු හා අනුවදකයෙකු බවට කදිම සාක්ෂියකි. තම ජීවන අත්දැකීම් අලලා ඩී. බී. කුරුප්පු ලියූ 'හැන්දෑවට පායන හිරු', 'මග හොඳට නොතිබුනත්', ආදී පොත් ඔහුගේ ජීවන තොරතුරු පමණක් නොව දශක හත අටත් පුරා ශ්‍රී ලංකාවත් ඕස්ට්‍රේලියාවත් සමාජ සංස්කෘතික හා දේශපාලන ඉතිහාසයේ වැදගත් සිදුවීම් හෙළිකරණ .......... වැනිය. ඩී.බී. ගේ ගෝලයෝ අප මව්බිමේ මෙන්ම ... ගුරු විශිෂ්ඨ තනතුර දරමින් සිටිති. පසුගිය මා-සයේ මව්බිමට ගිය එක් අවස්ථාවකදී මට මහාචාර්ය ජේ.බී. දිසානායක හමුවිය. තම ගුරුවරයා වූ ඩී. බී. කුරුප්පු මහතා ගැන මගෙන් තොරතුරු විමසූ මහාචාර්යවරයා මහත් බැතියෙන් යුතුව කුරුප්පු මහතා සිහිපත් කළේය.

ඩී. බී. කුරුප්පු මහතා තරම් නිවැරදි වියත් සිංහල බසින් ලියූ ලේඛකයන් අපේ මව්බිමේ ඇතොත් ඒ ඉතාම අතලොස්සකි. ඩී. බී. ලියූ 'සරල සිංහල වියරණ විධි' නැමැති කුඩා ග්‍රන්ථය සිංහල බස හැසිරවීමටත්, නිවැරදි වියරණ සහිත වියත් හෙළ බසින් ලිවීමටත් ආධුනික මෙන්ම ප්‍රවීන් ලේඛකයන්ට මහත් අතවැලක් බව කිවමනාය.

විශාල උනන්දුවෙන් හා ආත්ම ශක්තියෙන් යුතු තරුණයෙකු මෙන් දිවි ගෙවූ කුරුප්පු මහතා මරණය පවා බලාපොරොත්තු වූයේ දැඩි සංයමයකින් හා .......උපහාස සිනාවක-ින් යුතුවයි. ඔහු අවසනට ලියූ පොත් කිහිපියකම ඒ ගැන ලියන්නට අමතක කලේ නැත. තම අවසන් දිනය ඔහු හැඳින්වූයේ 'සුබ මොහොත' ලෙසය ඔහුගේම වදනින් මෙසේය.

"දැන් මට හංගන්නට දෙයක් නැත. මා අතීතය සිහිපත් කරන්නේ උපේක්ෂා සහගතවය. අනාගතය දෙසද ඒ වගේම බලන්නට මම සමත් වෙමි.

ඒ සුබ මොහොත උදසාවෙන තෙක්ය.
(සැඳෑ තරු එළියේ කිම්දෙන හිරු පසුපිට කවරය)

ඩී. බී. කුරුප්පු මහතා ලියූ සෑම ලිපියකින්ම හැම පොතකින්ම පිළිබිඹු වන්නේ ඔහුගේ නිර්භය බව, එඩිතර කම, බහුශ්‍රතභාවය හා හැම දෙයක් දෙසම විමසුම් ඇසින් බලා තම හිතට එකඟව තම අදහස් උදහස් නොබියව පළ කිරීමේ විශිෂ්ඨ හැකියාවයි. එතුමන්ගේ පොත් කියවීමෙන් අපට උගත හැකි දේ බොහෝය. ඩී. බී. කුරුප්පු මහතා ලියූ පොත් විචාර බුද්ධියෙන් යුතුව කියවීම එතුමන්ට දැක්විය හැකි ලොකුම උපහාරය බව මගේ හැඟීමයි. කුරුප්පු මහතා දිවියෙන් සමුගන්නා තෙක් වූ එකම බලාපොරොත්තුව ද එය බව මම දනිමි.



**Alpha Academy 2017**
Glen Waverley Classes

Grade 8 , 9 - Mathematics
Grade 8 , 9 - Science
Grade 8 ,9 - English
VCE Chemistry 1 , 2
VCE Biology 1 , 2
Other subjects - Upon request

- All students will be tested before enrolment , placed accordingly in the groups
- Unit Tests for all subjects
- VCE , SAC preparation guidance
- Ongoing updates for parents
- Multiple classes during week , enabling catch-up classes

**To request an application, please text student name, Class and school to 0457908918**